# The Kiss of Life

**නැතහොත් ජීවිත හාදුව ලෙස හඳුන්වන මෙම ඡායාරූපය සිය කැමරා-වේ අහම්බෙන් සටහන් කර ගන්න ලද්දේ ෆ්ලොරීඩාහි මාධ්‍යවේදියෙකු වූ රොකෝ මොරාබිටෝ විසින් 1967 ජූලි මස 26 වන දින සිය මෝටර් රථය පදවමින් සිටි අතරතුර දීය.**



ඡායාරූපයෙන් දැක්වෙන්නේ රැන්ඩොල් චැම්පියන් සහ ජේ. ඩී තොම්සන් යන විදුලි රැහැන් සේවකයන් දෙදෙනාය. එම අවස්ථාවේදී ඔවුන් දෙදෙනා විසින් රැහැනක නඩත්තු කටයුත්තක් සිදු කරමින් සිටින අතරතුර විදුලි කණුව මුදුනේ සිටි රැන්ඩොල් චැම්පියන්ට වෝල්ට් 4000 අධිබලැති විදුලි සැර වැදුණි. කෙසේ වෙතත් ආධාරක කම්බි කේබලය හේතුවෙන් ඔහුගේ අඩපන වූ සිරුර බිමට නොවැටුණු අතර ඒ වන විට එහි පහළ කොටසේ නඩත්තු කටයුතු කළ තොම්සන් හැකි ඉක්මනින් සිය සගයාගෙ එල්ලෙන සිරුර දෙසට නැග යන්නට සමත් විය. සිය සගයාගේ එල්ලා වැටෙන සිරුරට ළංවී හැකි ඉක්මනින් කෘතිම ශ්වසනය ලබා දීමෙන් පසුව චැම්පියන්ගේ ශරීරයේ ගැස්මක් සහ නාඩි වැටීමක් ඇතිවූ බව තේරුම් ගත් තොම්සන් සිය සගයාට අඛණ්ඩව කෘතිම ශ්වසනය ලබාදීමට කටයුතු කල අතර ඉන්පසු රැහැන් වලින් ලිහා ගත් චැම්පියන්ගේ සිරුර කරමත තබා බිමට රැගෙන එන්නට සමත් විය. ඒ වනවිට බිම සිටි තවත් විදුලි සේවකයෙකු සමග එක්වී චැම්පියන් හට යලිත් පපු තෙරපුම් ක්‍රමයට කෘතිම ශ්වසනය ලබාදීමට තොම්සන් කටයුතු කළ අතර තරමක් දුරට සිරුර යළි ප්‍රාණවත් වන්නට විය. වෛද්‍යවරුන්ගේ හදිසි කැඳවීමත් සමට රැන්ඩෝල් චැම්පියන්ගේ ජීවිතය බේරාගැනීමට ඔවුහු සමත් වූහ.

මෙලෙස දිවි බේරාගත් රැන්ඩොල් චැම්පියන් ඉන්පසුව තවත් 37ක් වසක් ජීවත් ව 2002 දී මිය යන විට අවුරුදු 67ක් ඉක්මවා තිබිණි. ඔහුගේ දිවි බේරාගත් ජේ. ඩී තොම්සන් (85) අදත් දකුණු ෆ්ලොරිඩාවේ ජීවත් වෙයි. ජීවිත හාදුව (ඔයැ ණසි දල ඛසැ) ලෙස ස්පොට් නිවුස් සඟරාවේ (වදච හැඅි ඒ‍ට්'සබැ) පළවූ මෙම ඡායාරූපයට 1968 පුලිට්සර් සම්මානය හිමිවූ අතර ඡායාරූප ශිල්පී රොකෝ මොරබිටෝ 2009 දි ජීවිතයෙන් සමුගත්තේය.

**(ප්‍රගීත් රත්නායකගේ ෆේස් බුක් පිටුවෙන් උපුටාගන්නා ලද්දකි)**

42 වන පිටෙන්

සමග තාරුණ්‍ය ජයගැනීම මෙම අවසානයෙ-න් ප්‍රකාශ වෙයි. නපුරු මූකලානක් ද, සර්ප විමානයක් ද, හොල්මන් අවතාර වලින්ද යුත්, ජනශූන්‍ය වූ මෙම දූපත හා බැඳුණු අද්භූත තොරතුරු ප්‍රායෝගිකව ගවේෂණය කිරීම ඔවුන්ට ජයගැනීමට තිබූ ඉමහත් අභියෝගය විය. මඩොල්දූව තරණය ඔවුන් තුළ මෙතෙක් ඉටු කර ගත නොහී සැඟවී තිබූ පාරිසරික කුතුහලය හා ශ්‍රම ශක්තිය විදාරණය කිරීමට ඉඩ ලත් භාග්‍යය-ක් විය. ආරක්ෂාවට ගමරාළ ගෙන් ලැබුණු පතරොම් තුවක්කුවත් එය පාවිච්චි කිරීමට පුහුණුවත් වගාකිරීමට උපකරණයත් යාත්‍රා කිරීමට යොදාගත් බලු පැටවාත් මෙතෙක් ඔවුන් ලබා තිබූ පාරිසරික අත්දැකීම් ද මඩොල්දූව සරුසාර රජදහනක් කිරීමට හේතුවිය. එම ජීවත් වූ පොඩි ගමරාළ පවා අත ගැසීමට පවා බිය වූ පරිසරයක හිමිකරුවෙක් වීමට උපාලි සහ ජින්නා පත්වෙන්න උත්තේජන ඔවුන් පරිසරය ආශ්‍රිතව ලබා ගත් ආශිර්වාදයක් විය. උපාලි ගිනිවැල්ලේ චරිතය සමාජයේ බාල පරපුරට ආදර්ශයකි. නොපසුබස්නා එඩිය හා වීරත්වය ජිනානාට හොරෙන් ඔරුව පැදගෙන ගොස් භයානක දුවට ගොඩබැස කළ ගවේෂණ-යෙන් ප්‍රකට වෙයි. පරිසර අධ්‍යයනයෙන් ලබාග න්නා විඥානය ජින්නාගේ කුහුල ද වැඩි කළේය. පදිංචි විය හැකි ගල් ගුහාව, ඒ අසබඩ පිහිටි දිය පොකුණ හා සරුසාර පස ඔවුන්ගේ ශක්තිය සමඟ මුසු වී රටට විවෘත වූ සරුසාර බිමක් බවට පත්විය.

මඩොල්දුව තරණයෙන් පසු ඒ හා බැඳුන නවකතා හා විශ්වාසය පිළිබඳව ප්‍රචාරය වූ ගුප්තයන් විමසා බලන තුරු ඔවුන්ට ඉස්පාසුවක් නොවීය. ඒ අතර ගිනි හුලක් සමග පාවෙන අවතාරය පිළිබඳ සැකය ද ප්‍රධාන විය. සමහර දිනවල ඇය බිය ගන්වන ගැහැනියක් පදවන ඔරුවේ දර්ශනය ද එවැනි සැකයකි. මෙම අද්භූත ආගන්තුකයා සෙවීමට යාමට ඔවුන් සූදානම් වීමේදී ජින්නාට නයකු දෂ්ට කිරීම, ඊට බෙහෙත් කිරීම, අනවසර වගාවන් පරීක්ෂාවට නිලධාරීන් කඩාවැදීම ආදී බාධක ජයග්‍රහණ ඒ-වාට සාර්ථකව මුහුණ පාමින්ය. අවසානයේ දුවේ නීත්‍යානුකූල අයිතිය පවා ඔවුන්ට හිමි වේ.

කුතුහලයට පත් වූ ඇවිදින ගින්න සෙවීමට දූපතේ අනෙක් පසට ඔවුන් කළ ගමන ත්‍රාසජනක රසයෙන් පිරී ගියේ එකකි. කිඹුලන්ගෙන් ගහන නව පරිසරයකට ගොඩබැස එළිමහන් තැනකට පැමිණීම සමග ඔවුනට ඇසුණු උගුර පාදන හඬ භීතියක් මෙන්ම කුතුහලයක්ද ඇති කළේය. තුවක්කුවද මානාගෙන විමසන විට අනෙක් පසින් නිකුත් වූ වෙඩිහඬ ඔවුන් තැති ගැනීමකට පත්කළත් හඹාගොස් හැඩිදැඩි මිනිසා කොටු කළේ ඉවතට වෙඩිල්ලක් තබමිනි. යටත් කරගත් ඔහුගෙ න් ප්‍රශ්න කිරීමේදී සැඟවී තිබූ රහස් රැසක් හෙළිදරවු කරගැනීමට හැකිවිය. දූපතේ දීර්ඝ කාලයක් සැඟවී සිට ලබාගත් අත්දැකීම් සමග රාත්‍රියට පත්තු කරන ගිනි පූජාව පමණක් නොව තමා සැඟවී සිටින මිනීමරුවකු බවත් ඉඳහිට අවශ්‍ය දේවල් රැගෙන රාත්‍රියට එන කාන්තාව තමාගේ බිරිඳ බවත්, හෙළිදරව් කෙරිනි. ඔහු ගැන කිසිවෙකුට හෙළිදරව් නොකරන ලෙසට කළ ඉල්ලීමද පිළිගැණුනි. දෙපිරිස අතර ඇතිකරගත් සුහදතාවය දූපතේ සංවර්ධනය සඳහා යොදාගැනීමට තීරණය කෙරිණි.

දූපතේ ස්ථිර ගෙයක්ද සාදා නිම වූ එක් දිනක උපාලිට ලැබෙන තොරතුරකින් තම කුඩම්මා විසින්, අසනීපයෙන් සිටින පියා බැලීමට පැමිණෙන ලෙසට පළවූ පුවත්පත් දැන්වීම් ඉල්ලීම ලැබේ. ගමේ සියල්ල විශ්මයට පත්කරමින් උපාලි ගමට පැමිණෙන්නේ ප්‍රීතිමයනි. එහෙත් අසාධ්‍ය තත්ත්වයෙන් සිටි පියා ගේ අවසානය අවවාදවලින් සතියකට පසු පියා මිය යන්නේ උපාලිට ප්‍රශ්න රාශියක් ඉතිරි කරමිනි. උපාලි ආපසු මඩොල්දූවට එන්නේ වික්ෂිප්ත මනසකිනි. මඩොල්දූව නිමවන්නේ උපාලිගේ මෙම සිතුවිල්ලෙනි. "පියා මළේය. අකාලයේ නාකි-වුනු කුඩම්මා අතීතය සිහිකරමින් ශෝක වෙයි. අනාගතය බලා බියෙන්ද තනි කමෙන් ද තැවෙයි. මගේ පැරණි යහළුවන් දකින්නට ලැබුණොත් ලැබෙන්නේ කලාතුරකිනි. "ජින්නා ළඟදීම ආයෙත් ගමට ගොහින් එන්න ඕනේ" මම කීවෙමි. මට මෙසේ කියවුනේ මගේ සිත දෙමිනසින් පෙළෙන්නට වූ බැවිනි.





